Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## අධිකරණ සේවා කොමිෂන් සභාව

## ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුරට බඳවා ගැනීම - 2017

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත. ඒ අනුව පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

02. මසකට රු. 47,615 - 10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 - 110,895 ක වැටුප් පරිමාණයක් මෙම තනතුරට අයත්ය. (ආරම්භක වැටුප් පියවර මෙම වැටුප් පරිමාණයේ (SL 1-2016) 16 වන වැටුප් පියවර (රු. 69,115) වේ. 2020.01.01 දක්වා රා. ප. ච. 03/2016 උපලේඛන II හි පරිදි වැටුප් ගෙවනු ලැබේ.)

03. සුදුසුකම් :

(*අ*) ශ්‍රී ලංකා අභියාචනාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයෙකු නම් හා එම තනතුරෙහි ස්ථිර කර තිබේනම්, *හෝ*

(*ආ*) (i) අවුරුදු 07 කට නොඅඩු කාලයක් ක්‍රියාකාරී ලෙස වෘත්තියේ යෙදී සිටි නීතිඥවරයෙකු නම්, *සහ*

(ii) අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවු. 30 ට නොඅඩු සහ අවුරුදු 40ට නොවැඩි විය යුතුය.

*සටහන.*-යම් අමාත්‍යාංශයක, රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක නීතිඥවරයෙකු වශයෙන් මාණ්ඩලික තනතුරක හෝ නෛතික තත්ත්වයෙන් හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ නීති විද්‍යාලයක නීතිය පිළිබඳව ගුරුවරයෙකු වශයෙන් හෝ ශ්‍රී ලංකා අධිකරණ සේවයේ නිලධරයෙකු වශයෙන් හෝ කම්කරු විනිශ්චයාධිකාරයක හෝ ගම්බද උසාවියක සභාපතිවරයෙකු වශයෙන් සේවය කළ කාලපරිච්ඡේදය ''ක්‍රියාකාරී වෘත්තියෙහි යෙදී සිටි'' කාලපරිච්ඡේදය වශයෙන් සලකනු ලැබේ.

04. සෑම අයදුම්කරුවෙක්ම :

(*අ*) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(*ආ*) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

05. පහත සඳහන් ලිපි ලේඛණ ඉල්ලා සිටි විට ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන්ට හැකි විය යුතුය.

(*අ*) උප්පැන්න සහතිකය;

(*ආ*) උසස්ම අධ්‍යාපන සහතිකය;

(*ඇ*) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය;

(*ඈ*) සිංහලෙන්, දෙමළෙන්, ඉංග්‍රීසියෙන් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

06. සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව තෝරාගන්නා අයදුම්කරුවන් කොළඹ 12, ශ්‍රේෂ්ඨාධිකරණයේ සේවය කළ යුතුය.

07. මෙම තනතුර සඳහා අයදුම් කරන්නන් මෙහි සඳහන් ආදර්ශ ආකෘතිය අනුව අයදුම්පත පිළියෙල කළ යුතු අතර, එය 2017.03.31 වැනි දිනට හෝ එදිනට පෙර ''ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය, කොළඹ 12 යන ලිපිනයට ලේඛණගත තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ'' ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුරට බඳවා ගැනීම - 2017'' ලෙසට සඳහන් කළ යුතුය. අයදුම්පත්‍ර බාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් හා නියමිත සුදුසුකම් සපුරා නොමැතිව එවන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂප කරනු ලැබේ.

08. රජයේ, රාජ්‍ය සංස්ථා සේවයේ නියුක්තව සිටින නිලධරයන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

ප්‍රදීප් ජයතිලක,
මහාධිකරණ විනිසුරු/*වැඩ බලන ලේකම්*
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2017 පෙබරවාරි මස 09 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

## ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුර සඳහා බඳවා ගැනීමේ අයදුම්පත්‍රය - 2017

1. (i) මුලකුරු සමග නම (සිංහලෙන්) :—————.
   මයා/මිය/මෙනවිය
   (ii) මුලකුරු සමග නම (ඉංග්‍රීසියෙන්) :—————.

2. මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————.
   (සිංහලෙන්)

3. (i) උපන් දිනය : අවුරුද්ද :———. මාසය :———. දිනය :———.
   (ii) 2017.03.31 දිනට වයස : අවු :————. මාස :————.
   දින :————.

4. (i) ස්ථිර පදිංචි ලිපිනය :—————.
   (ii) එය අයත් දිස්ත්‍රික්කය :—————.

5. ජාතික හැඳුනුම්පත් අංකය :—————.
6. දුරකථන අංක : (i) නිවස :—————. (ii) ජංගම :—————.

7. ශ්‍රී ලංකා අභියාචනාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් වරයෙකු ලෙස ඉල්ලුම් කරන්නේ නම්,
   (i) අභියාචනාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුරට පත්වූ දිනය :—————.
   (ii) එම තනතුරෙහි ස්ථිර කළ දිනය :—————.
   (iii) සේවා කාලය තුළ යම් කිසි විනයානුකූල දඬුවමකට යටත්ව තිබේද? :—————.
   (iv) එසේ නම් ඒ පිළිබඳව විස්තර :—————.

8. නීතිඥවරයෙකු ලෙස ඉල්ලුම් කරන්නේ නම්,
   (i) නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දුන් දිනය :—————.
   (ii) දැනට ක්‍රියාකාරී ලෙස වෘත්තියේ යෙදෙන අධිකරණයන් :—————.
   (iii) යම් අමාත්‍යාංශයක, රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක, පිළිගත් විශ්ව විද්‍යාලයක, නීති විද්‍යාලයක, ශ්‍රී ලංකා අධිකරණ සේවයේ යෙදී සිටින්නේ නම්,
      (i) පත්වීම් දිනය :—————.
      (ii) තනතුර හා ශ්‍රේණිය :—————.
      (iii) දෙපාර්තමේන්තුව හා වර්තමාන සේවා ස්ථානය :—————.
      (iv) තනතුර ස්ථිර කළ දිනය :—————.
      (v) සේවා කාලය තුළ යම් කිසි විනයානුකූල දඬුවමකට යටත්ව තිබේද? :—————.
      (vi) එසේ නම් ඒ පිළිබඳව විස්තර :—————.

09. (i) අධිකරණයකින් ඔබ යම් කිසි වරදකට වරදකරු වී තිබේ ද ?
    (ii) එසේ නම් ඒ පිළිබඳව තොරතුරු දක්වන්න.

මා විසින් ඉහත දක්වූ සියළු තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම*
(දැනට රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා අදාල නොවේ.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................ මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්වා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිටදී ................ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

—————,
අත්සන සහතික කරන අයගේ අත්සන

දිනය :—————.

(අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු හෝ රු. 47,615 හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කල යුතුය.)

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය*

මෙම .................. සේවය කරන .......................... මයා/මිය/මෙනවියට ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් තනතුරට ඉල්ලුම්කිරීමට අවශ්‍ය වෘත්තීය සුදුසුකම් ඇති බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදාහරින බවද ඔහුට/ඇයට ඉල්ලුම්පත්‍ර කැඳවන අවසාන දිනට වයස අවු. 40ට නොවැඩි බවද, ඔහු/ඇය මා ඉදිරිපිටදී අත්සන් කළ බවද ඔහුගේ/ඇයගේ ඉල්ලුම්පත්‍රය නිර්දේශ කර මේ සමග ඉදිරිපත් කරමි.

_____________,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
මුද්‍රාව.

දිනය :—————.